# මගේ පූංචි ටිචි



චාතුර්යා තිසරණී පතිරණ
(කර්තෘ)

# මගේ පුංචි රිචි

කර්තෘ : සී.පී.පතිරණ

ISBN 978-624-206-796-4

පළමු පිටපත සහ මුද්‍රණය

2023 ඔක්තෝම්බර් 25

කතාව සහ චිත්‍ර

චාතුර්යා තිසරණි පතිරණ.

2 වසර E

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර.

# පිදුම.

මාගේ උතුම් පාසල වන

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ

මාගේ ආදරණීය විදුහල්පතිනිය වන

ශෂිකලා සේනාධීර මහත්මියට

සහ

මාගේ පන්ති භාර ගුරුමැණියන් වන

චාමිණි පල්ලියගුරු ගුරුමියටත්

දෙමව්පියණ්ට සෙනහසින් පුදමි...

# පෙරවදන.

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්වෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසල් දර්ශණයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටගේ ලේඛනකරණය සහඡයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්තකරණයට යොම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිතය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ගේ අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතටය එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහොදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිතය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන් මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනය මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසවල් කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂයාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙවනවිරත්න මහලේකම්ගේද සේවය අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)
මහමායා බාලිකා විද්‍යාලය -මහනුවර 2023.10.20

එක දවසක
අම්මයි, තාත්තයි,
අක්කයි , අයියයි
අපි හැමෝම
කතා වුණා බලු
පැටියෙක් ගේමු
කියලා.



එදාම හවස තාත්තා රත්තරන් පාට ලොකු බෝලයක් වගේ පුළුන් කොට්ටයක් වගේ බලූ පැටියෙක් ගෙනත් දුන්නා.

අපි බලු බාබාට

“රිචී” කියලා

නමකුත් දැම්මා.

එයා හරිම හුරතල්

එයාව දැක්කම

ගොඩාක් ආදරේ

හිතෙනවා.



එයාගේ අම්මා නැති නිසා ඊච් ගොඩාක් ඇඬුවා .

ඉතින් රිචීට අපේ අම්මා එයාගේ අම්මා වෙලා ළඟින් තියාගෙන නිදා ගත්තා.

රිචී කන්න කැමති

මාළුයි බතුයි.

දවසට හතර

පාරක් අපි එයාට

කෑම දෙනවා.

හැම මාසේම

බරත් කිරනවා.



අපි රිචීව

ආදරෙන් බලා

ගත්තා .රිචීට

අවුරුදු දෙකක්

වෙනකොට බලූ

බාබාලා හය

දෙනෙක්

ලැබුණා.



අපේ අම්මාත් ගෙදර හැමෝමත් බලූ බබාලාව ආදරයෙන් බලා ගත්තා . බලූ බාබාලත් හරිම හුරතල්.

මට හරිම සතුටුයි.

මට දැන් බලු

බබාලා එක්ක

සෙල්ලම්

කරන්නත්

පුළුවන්.



# පසුවදන.



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථක පරිවර්තනයන් හේතුකොට ගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීපකරවිම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරිම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂන ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩ නැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟිම් දැනිම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හීක්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසාත් ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට අලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනෙවිරත්න මහ ලේකම්

පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකල ව්‍යාපෘතියේ නිර්මාතෘ

**2023.10.20**

**ISBN 978-624-206-796-4**